# සවියෙන් පෙරට අපි එකට
# e ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
|---|---|---|---|
| 07 | සිංහල භාෂාව හා සාහිත්‍යය | පළමු වාරය | ඔයි රයිරේ ඔයි රාමා |

සැකසුම : කේ. අනුෂ්කා ශාමලී පෙරේරා

බප/හො/වැවිට මෛත්‍රී මහා විද්‍යාලය

# 07 ශ්‍රේණිය
# 04 පාඩම
# ඔයි රයිරේ ඔයි රාමා

- නිපුණතාව 5.0 : භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාරය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

- නිපුණතා මට්ටම 5.3 : භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනාගෙන භාෂාව භාවිතා කරයි.

- ඉගෙනුම් ඵල :
  1. කෘෂි කර්මාන්තය හා බැඳුණු ව්‍යවහාරයේ විවිධතා හඳුනාගෙන පැහැදිලි කරයි.
  2. වී ගොවිතැන හා බැඳුණු භාෂා ව්‍යවහාර හඳුනාගෙන ඉදිරිපත් කරයි.
  3. වී ගොවිතැන ආශ්‍රිත වචන අර්ථවත්ව භාවිතා කරයි.

# හැඳින්වීම

## සිංහලයාගේ භාෂාව සිංහල භාෂාවයි. නමුත්

- භූගෝලීය සාධක
- නිෂ්පාදන ක්‍රම
- ඇදහිලි
- සිතුම් පැතුම්
- පාරිසරික විශේෂතා
- ජීවන ක්‍රම
- විශ්වාස

ආදී හේතු මත විවිධ භාෂා ව්‍යවහාර සිංහල බසට එකතු වී ඇත. ඒ පහත ආකාරයෙනි.

- ✓ කමත් බස
- ✓ වැදි භාෂාව
- ✓ ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂාව
- ✓ අභිකුණ්ඨික භාෂාව
- ✓ පතල් කර්මාන්තය ආශ්‍රිත භාෂාව

# විවිධ භාෂා හා සබැඳි වෘත්තීන්








# කමත් බස

- වී ගොවිතැන යනු ශ්‍රී ලාංකීය ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයයි.
- වී ගොවිතැන හා බැඳුණු සිරිත් විරිත් රාශියක් ශ්‍රී ලාංකිකයන් සතුව ඇත.
- “වී” බුද්ධ භෝගයක් ලෙස සැලකෙන අතර කමත හා වී අතර බුදුන් වහන්සේගේ හා දෙවියන්ගේ සබැඳියාවක් ඇති බව සිංහලයෝ විශ්වාස කරති.
- ඉහත සියලු සාධක හේතුවෙන් වී ගොවිතැන හා බැඳුණු බස් වහරක් හා සිරිත් විරිත් සමුදායක් අපට හමු වේ.

# කමත හා බැඳුණු රූප පෙළක්





ගොවි අස්වැන්න රැස්කරන සඳහා වූ සාම්ප්‍රදායික වී බිස්ස





# පාඩමට ප්‍රවේශ වෙමු.

- “ඔයි රයිරේ ඔයි රාමා” පාඩම ඔස්සේ ඔබට කමත හා බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ කමත් බස අනුසාරයෙන් ඉදිරිපත් කර ඇත.
- පාඩමේ කතාව සැකෙවින්
- අනුරාධ ඔහුගේ මව සමග මාමාගේ නිවසට පාසල් නිවාඩුව ගත කිරීමට යන්නේ සතුටු සිතින් ය.
- එදින මාමාගේ කුඹුරේ ගොයම් පෑගීම ද යෙදී තිබීම නිසා අනුරාධගේ ප්‍රීතිය දෙගුණ තෙගුණ විය.
- අනුරාධ එම දිනයේ දී මාමාගේ කමතට ගොස් ගොයම් පෑගීමේ අත්දැකීම් ද එහි සිදුවන චාරිත්‍ර වාරිත්‍ර ද බස ද ඉගෙන ගත්තේ ය.

**කමතේ දී අනුරාධට හමු වූ අපූරු චරිත**

- සිරිමල් - අයියා
- දාවිත් රාලහාමි - මාමා
- බණ්ඩාර මැණිකේ - නැන්දා
- මැගිලින් - ගැමි කාන්තාවක්
- සාදිරිස් උන්නැහේ - ගැමියෙක්
- විලියම් - ගැමියෙක්
- බිසෝ මැණිකේ - ගැමි කාන්තාවක්

# කමත් බසට අදාළ වචන කීපයක් බලමු, උගනිමු.

යතුර - කුල්ල



ලියන්නාව - දෑකැත්ත



අම්බරුවන් - හරක්



කිරි කබළු - ආප්ප



රත්තා බෝ කිරීම - ගිනි මැල ගැසීම



මැඩුවන් - පිදුරු



- ඉපනැල්ල - ගොයම් කපා ඉතිරි වූ කොටස
- කෙවිට - කෝටුව
- කුඹල් ගෙඩිය - කලය

# නාම පද

- නිපුණතාව 6.0 : සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.
- නිපුණතා මට්ටම 6.1 : නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛනයේ යෙදෙයි.
- ඉගෙනුම් ඵල : - නාම පද වල වචන, පුරුෂ, ලිංග භේද හඳුනාගෙන ඉදිරිපත් කරයි.

  - නාම පද වල වචන, පුරුෂ, ලිංග භේදය භාෂාවේ යෙදෙන ආකාරය පැහැදිලි කරයි.


  - නාම පද වල වචන භේදය පුරුෂ භේදය ලිංග භේදය සැකවින් වාක්‍යය නිර්මාණය කරයි.

**නාම පද යනු,**

- කිසියම් කෙනෙක් - අම්මා, ගුරුතුමා, නංගී, වෛද්‍යවරයා, කුරුල්ලා
- දෙයක් - පුටුව, පොත, පෑන, නිවස, ගස
- ස්ථානයක් - රෝහල, පන්සල, පාසල, නගරය
- ස්වභාවයක් - ප්‍රසන්න, ලස්සන, අඳුරු, බිය, ලැජ්ජාව

හඟවන පදයි.

# නාම පද ප්‍රභේද කරමු



# වචන භේදය

ඒක වචන - එක් දෙයක්, අයෙක් හඟවන පදයි.
බහු වචන - එක් දෙයකට වැඩියෙන් ඇති දේවල් හෝ එක් අයෙකුට වඩා වැඩියෙන් සිටින කණ්ඩායම් හඟවන පදයි.

## ඒක වචන නාම බහු වචන වන ක්‍රම

| ඒක වචන | බහු වචන |
|---|---|
| I ක්‍රමය | |
| අම්මා<br>මාමා | අම්මලා<br>මාමලා |
| II ක්‍රමය | |
| කුඹුර<br>යතුර | කුඹුරු<br>යතුරු |
| III ක්‍රමය | |
| කමත<br>ගොයම | කමත්<br>ගොයම් |
| | |

| ඒක වචන | බහු වචන |
| --- | --- |
| IV ක්‍රමය | |
| චාරිත්‍රය<br>යන්ත්‍රය | චාරිත්‍ර<br>යන්ත්‍ර |
| V ක්‍රමය | |
| කුල්ල<br>මල්ල | කුලු<br>මලු |
| VI ක්‍රමය | |
| වල | වලවල් |
| VII ක්‍රමය | |
| අම්බරුවා<br>රෝගියා | අම්බරුවෝ<br>රෝගියෝ |

# වචන භේදය අනුව වාක්‍යය නිර්මාණය උගනිමු.

- ඒක වචන නාම පදයක් වාක්‍යයක උක්තය වන විට ආඛ්‍යාතය ඒක වචන වේ.

  උදා: අම්මා දර කඩයි. - තාත්තා වැඩට යයි.

- බහු වචන නාම පදයක් වාක්‍යයක උක්තය වන විට ආඛ්‍යාතය බහු වචන වේ.

  උදා: අම්මලා දර කඩති. - තාත්තලා වැඩට යති.

- අප්‍රාණවාචී පදයක් වාක්‍යයක උක්තය වන විට එය බහු වචන වුවත් ඒක වචන වුවත් ආඛ්‍යාතය ඒක වචන වේ.

  උදා: ගඟ ගලා බසියි. - ගංගා ගලා බසියි.

# පුරුෂ භේදය

## පුරුෂ භේදය අනුව නාම පද ප්‍රභේද 03 කි.

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| | | |
| උත්තම | මම | අපි |
| | | |
| මධ්‍යම | තෝ<br>නුඹ<br>ඔබ | තොපි<br>නුඹලා<br>ඔබලා |
| | | |
| ප්‍රථම | හේ, ඔහු, ඇය<br>පැන<br>අම්මා | ඔවුහු<br>පැන්<br>අම්මලා |

# පුරුෂ භේදය අනුව නාම පද වාක්‍යය වල දමමු.

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| | | |
| උත්තම | මම බත් කමි | අපි බත් කමු |
| | | |
| මධ්‍යම | තෝ බත් කන්නෙහි<br>ඔබ බත් කන්නෙහි | තොපි බත් කන්නෙහි<br>ඔබලා බත් කන්නේහු |
| | | |
| ප්‍රථම | ඇය බත් කයි<br>කුරුල්ලා ගී ගයයි | ඔවුහු බත් කති<br>කුරුල්ලෝ ගී ගයති |

# ලිංග භේදය

- පුරුෂ ලිංග - ස්ත්‍රී ලිංග - නපුංසක ලිංග

- පුරුෂ වාචී පද පුරුෂ ලිංග වේ.

  වෛද්‍යවරයා, ගුරුවරයා, කුරුල්ලා

- ස්ත්‍රී වාචී පද ස්ත්‍රී ලිංග වේ.

  වෛද්‍යවරිය, ගුරුවරිය, කිරිල්ලී

- අප්‍රාණවාචී පද නපුංසක ලිංග වේ.

  මල, ගල, පුටුව, අහස

# පුරුෂ වාචී පද ස්ත්‍රී වාචී පද කරගන්නා ආකාර

| පුරුෂ වාචී | ස්ත්‍රී වාචී |
| --- | --- |
| I ක්‍රමය | |
| කුමරා<br>රජ | කුමරි<br>රැජිණ |
| II ක්‍රමය | |
| එළුවා<br>හංසයා | එළුදෙන / එළිච්චි<br>හංස ධේනුව |
| III ක්‍රමය | |
| ළමයා<br>මහත්තයා | ගැහැනු ළමයා<br>නෝනා මහත්තයා |
| IV ක්‍රමය | |
| අශ්වයා<br>මොනරා | වෙළඹ<br>සෙබඩ |
| V ක්‍රමය | |
| සොර<br>කවුඩු | සෙර<br>කැවිඩි |

## ❖ ලිංග භේදය අනුව නාම පද වාක්‍යය වල දමමු.

| ඒක වචන | | |
|---|---|---|
| කාලය | පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
| වර්තමාන | තාත්තා වැඩ කරයි | අම්මා වැඩ කරයි |
| අනාගත | තාත්තා වැඩ කරයි | අම්මා වැඩ කරන්නී ය |
| අතීත | තාත්තා වැඩ කළේ ය | අම්මා වැඩ කළා ය |
| බහු වචන | | |
| කාලය | පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
| වර්තමාන | තාත්තලා වැඩ කරති | අම්මලා වැඩ කරති |
| අනාගත | තාත්තලා වැඩ කරති / කරන්නෝ ය | අම්මලා වැඩ කරති / කරන්නෝ ය |
| අතීත | තාත්තලා වැඩ කළහ | අම්මලා වැඩ කළහ / කළෝ ය |